**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**කළමනාකරණ අධ්‍යයන පීඨය**

**ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතික පත්‍ර පාඨමාලාව (ESBM)**

**AFC 2308 ආර්ථික විද්‍යාව හැඳින්වීම්**
**අවසාන පරීක්ෂණය - 2023/2024**
**කාලය - පැය දෙකයි (02)**

***දිනය: 2024 අගෝස්තු 10*** | ***වේලාව: ප.ව. 1.30 - ප.ව. 3.30.***

**උපදෙස්:**
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- කරුණාකර ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ ලබා දී ඇති ඉඩෙහි දක්වන්න
- මෙම ප්‍රශ්න පත්‍රය පිටු තුනකින් (03) සමන්විත වේ.
- පිළිතුරු පත්‍රය ඔබේ පිළිතුරු පොත් පිංචට අමුණන්න.
- සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමිවේ (ලකුණු 25 බැගින්)
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

**ප්‍රශ්නය අංක 01.**

i. භාණ්ඩයක ආවස්ථික පිරිවැය වැඩිවන බව උදාහරණයක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

ii. පහත දැක්වෙන සිද්ධි නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක දක්වන්නේ කෙසේද?
   a. සමාජ සුභසාධනයට වෙන්වන සම්පත්වල වැඩිවීමක්.
   b. කාර්යක්ෂම කළමනාකරණයක් නිසා එක් භාණ්ඩ වර්ගයක් සඳහා යෙදෙන සම්පත්වල ඵලදායිතාවය වැඩිවීමක්.

(ලකුණු 5 x 2 = ලකුණු 10)

iii. කිසියම් අවස්ථාවකදී ආර්ථිකයක පවතින නිමැවුම් මට්ටම තීරණය කරන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

**ප්‍රශ්නය අංක 02.**

i. ඉල්ලුම් න්‍යාය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. ඉල්ලුම් වක්‍රය දිගේ ගමන් කිරීම සහ ඉල්ලුම් වක්‍රය විතැන්වීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. සැපයුම නොවෙනස්ව පවතී යැයි උපකල්පනය කරමින්, පහත සඳහන් අවස්ථා අදාළ නිෂ්පාදනයේ සමතුලිත වෙළඳපල මිලට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.
   a. ආර්ථික අවපාතයක් හේතුවෙන් ගෘහාශ්‍රිත ආදායම සැලකිය යුතු ලෙස පහත වැටේ. මෙය කුකුළු මස් වෙළඳපොළ මිලට බලපාන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

b. උද්ධමනය මත මිල ගැලපීම හේතුවෙන් ආනයනික අරක්කු මිල ඉහල යයි. මෙය ආනයනික අරක්කු වෙළඳපොල මිලට බලපාන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

c. ක්ෂණික නූඩ්ල්ස් ආහාරයට ගැනීමෙන් ඇති විය හැකි සෞඛ්‍ය ගැටලු පිළිබඳ මාධ්‍ය ආවරණයකදී, පිළිකා කාරක ඇති බව හඳුනා ගනී. මෙය ක්ෂණික නූඩ්ල්ස් වෙළඳපොළ මිලට බලපාන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**ප්‍රශ්නය අංක 03.**

i. වෙළඳපළ සමතුලිතය යනු කුමක්ද? එය සත්‍ය වෙළඳපොළ තත්වයක් ද? නැතහොත් වෙළඳපොළ වෙනස් වන දිශාව පෙන්නුම් කරන දර්ශකයක්ද (Indicator)? කෙටියෙන පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. ප්‍රසිද්ධ ක්‍රීඩා ඩෙනිම් සන්නාමයක් වන 'Harris' සඳහා ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත දැක්වේ.

ඉල්ලුම සමීකරණය = $Qd = 50 - 5p$

සැපයුම් සමීකරණය = $Qs = -25 + 5p$

a. නිෂ්පාදනයේ සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න.

b. නිෂ්පාදනයේ සමතුලිත මිලෙහිදී මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න.

c. මෙම කර්මාන්තයේ මෑතකාලීන කාර්‍යසාධනය සැලකිල්ලට ගනිමින්, කර්මාන්තයේ සමාගම් සඳහා සහනාධාරයක් ලබා දීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත. මෙය නිෂ්පාදනයේ සමතුලිත මිලට බලපාන්නේ කෙසේද?.

(ලකුණු 18)

**ප්‍රශ්නය අංක 04.**

i. සාර්ව ආර්ථික විද්‍යාව යනු කුමක්ද? සාර්ව ආර්ථික විද්‍යාව සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් වෙනස් වන්නේ කෙසේද?. (ලකුණු 07)

ii. 2023 වර්ෂයේ තුන්වන කාර්තුව සඳහා ශ්‍රී ලංකා ආර්ථිකයට අදාළ දත්ත පහත දැක්වේ. සියලුම අගයන් රුපියල් බිලියන වලින්.

C= පුද්ගලික පරිභෝජන වියදම් රු. බිලියන 4,100 කි

I = දළ පුද්ගලික දේශීය ආයෝජනය රු. බිලියන 2,300 කි

G = රජයේ පරිභෝජන වියදම් රු. බිලියන 470 කි

X =භාණ්ඩ හා සේවා අපනයනය රු. බිලියන 2,400 කි

M =භාණ්ඩ හා සේවා ආනයනය රු. බිලියන 2,600 කි

a. පහත දත්ත භාවිතා කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා සමස්ත ඉල්ලුම (AD) ගණනය කරන්න

(ලකුණු 05)

b. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ දළ පෞද්ගලික දේශීය ආයෝජන (I) මට්ටමට බලපෑ හැකි සාධක කෙටියෙන පැහැදිලි කරන්න.

(ලකුණු 07)

c. 2023, 3 වන කාර්තුවේ ශ්‍රී ලංකාවේ ශුද්ධ භාණ්ඩ හා සේවා අපනයනවල වටිනාකම කොපමණද?. ශ්‍රී ලංකා ආර්ථිකයට මෙම වෙළඳ ශේෂයෙන් බලපෑ හැකි ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?

(ලකුණු 06)

**<u>ප්‍රශ්නය අංක 05.</u>**

i. ව්‍යවසායකත්වය යනු කුමක්ද?. එය කළමනාකරණයෙන් වෙනස් වන්නේ කෙසේද?. (ලකුණු 07)

ii. ආර්ථික වර්ධනය යනු කුමක්ද? පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ගැන ඔබට කුමක් කිව හැකිද?. ආර්ථික වර්ධනයට බලපාන සාධක ඇසුරින් විමසන්න. (ලකුණු 10)

iii. විරැකියාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?. පූර්ණ සේවා නියුක්තිය ආර්ථිකයක වැදගත් අරමුණක් ලෙස සලකන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 08)

*සියලුම හිමිකම් ඇවිරිණි.*